# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1805/24 – 2013 අප්‍රේල් 10 වැනි බදාදා – 2013.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

1995 ජූලි මස 25 වැනි දින අංක 881/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1995 අංක 67 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 03/ජේ/93/එල්ආර්බී/26-11.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කැල/16/ඉඅ/183.
2013 අප්‍රේල් මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, වේවැල්දූව සහ වෙදමුල්ල, වනවාසල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද ගම් 2774 හා 2011.07.28 දිනැති සංශෝධිත පිඹුරේ සඳහන් කැබලි අංක 16 කොටසක් වන හෙක්. 0.4016 අවසතු කිරීම සඳහා ගම් 3474 හා 2013.03.12 දිනැති සංශෝධිත ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.4016 ක් වූ කැබලි අංක 181 වශයෙන් පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින්, ප්‍රමාණයන්ගෙන් සහ මායිම්වලින් යුක්ත වූ ඉඩම් කොටස:

01. **කැබලි අංක 181 – කෝන්ගහකුඹුර, කෝන්ගහ ඕවිට, දොඹගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.4016**

උතුරට: මු.පි.ගම් 2774 හි කැබලි අංක 4; නැගෙනහිරට: කැබලි අංක 182; දකුණට: කැබලි අංක 172, නුවර පාරේ වරි. අංක සොයාගත නොහැකි ඉඩම සහ මු.පි.ගම් 2774 හි කැබලි අංක 4; බටහිරට: නුවර පාරේ වරි. අංක 821, 823 දරන ඉඩම් සහ කැබලි අංක 140, 139 සහ 180.

04 – 761

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2006 සැප්තැම්බර් මස 11 වැනි දින අංක 1462/05 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2006 අංක 280 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන


1A – G 17546 – 445 (2013/04)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2006/යූඩීජ්/114-11.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 6/3/1/422.
2013 අප්‍රේල් මස 08 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹුක පත්තුව සුළු කොට්ඨාසයේ, හොරණ (කොට්ඨාස අංක 3 හොරණ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කර ඇති මු.පි.ක. 3863 හා 2012.09.05 දිනැති සංශෝධිත මූලික පිඹුරේ කැබලි අංක 5 වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1190 ක් වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 5 – අම්බලමහේන, වරි. අංක 107, 111, 113/1, 117, සෝමානන්ද පාර – ප්‍රමාණය: හෙක්. 0.1190**

උතුරට: එස්. ඒ. සිරිපාල හිමිකම් කියන ඉඩම (හිපි 56837) සහ සී/ස රයිගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතිය හිමිකම් කියන ඉඩම (හිපි 56837); නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 6; බටහිරට: කැබලි අංක 6, සෝමානන්ද පාර සහ එස්. ඒ. සිරිපාල හිමිකම් කියන ඉඩම (හිපි 56837).

04 – 762

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 1080/7 හා 1999.05.19 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ ද, 1999 අංක 87 හා 1999.05.05 වැනි දින දරන ආඥාවේ කැබලි අක්ෂර 'බී' දරන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ.

එනමුත් මේ කියන ලද ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1080/7 හා 1999.05.19 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 1999 අංක 87 හා 1999.05.05 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අක්ෂර 'බී' දරන ඉඩම් කොටස මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 13/97/පීඅයිඑස්ඩී/578.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කේඔටී/එල්එන්ඩී/ඒසීකිව්වී/1/55.
2013 අප්‍රේල් මස 08 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක්කෝරළේ (බටහිර) සුළු කොට්ඨාසයේ, මතුගොබේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මාර/කේටීපී/98/66 හා 1998.10.28 වැනි දින දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 5.880 ක් පමණ වන එනසල්වත්ත මතුගොබේ කොටස නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'බී' – එනසල්වත්ත මතුගොබේ කොටස – ප්‍රමාණය: හෙක්. 5.880 ක් පමණ**

උතුරට: මහාමාර්ගය සහ පන්සල්වත්ත; නැගෙනහිරට: පන්සල්වත්ත සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට සහ බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

04 – 763

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 41 දරන ආඥාව**

මගේ අංකය: 4/3/10/2012/එල්ආර්බී/18.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: WGSWD&EIP/ACQ/KB/07.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) අතුරු විධාන ආඥාවට යටත්ව අංක 1796/18 සහ 2013.02.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2ඒ පිටුවේ ඉඩම් විස්තරයෙහි කැබලි අංක 08 හි ප්‍රමාණය හෙක්. 0.1740 ක් යන්න වෙනුවට හෙක්. 0.0030 ලෙස නිවැරදි විය යුතු බැවින් ඒ අනුව ඉහත සඳහන් ආඥාව සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 4/3/10/2012/එල්ආර්බී/18.
2013 අප්‍රේල් මස 08 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

04 – 764

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 42 දරන ආඥාව**

මගේ අංකය: 4/3/10/2012/එල්ආර්බී/19.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: WGSWD&EIP/ACQ/DW/01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) අතුරු විධාන ආඥාවට යටත්ව අංක 1796/18 සහ 2013.02.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 2ඒ පිටුවේ ඉඩම් විස්තරයෙහි ප්‍රගමන අනුරේඛන අංක සීඕ/ඩීඑස්ඕ/2012/326 හා 2013.11.05 යන්න වෙනුවට එහි දිනය 2012.11.05 ලෙස නිවැරදි විය යුතු බැවින් ඒ අනුව ඉහත සඳහන් ආඥාව සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/එල්ආර්බී/19.
2013 අප්‍රේල් මස 08 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැඳුර', 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

04 – 765

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.